# ජාතික සංවර්ධන පෙරමුණේ
# ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල

**1. ලංකාවේ දේශපාලනය පිරිසිදු කිරීම**

- නිර්දේශපාලනික නව ජනාධිපතිවරයෙක් ලෙස දිවුරුම් දීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98, 99 සහ 101 වගන්ති සංශෝධනය කර, මනාප නොමැති කේවල සහ සමානුපාත ක්‍රම දෙකෙහි සංකලනයෙන් යුතු දියුණු නව මැතිවරණ ක්‍රමයක් 2024 දීම ඇති කිරීම.
- නව මැතිවරණ ක්‍රමයෙන් 2025 දී පාර්ලිමේන්තු මැතිවරණය පවත්වා සෑම ආසනයකටම වගකියන මන්ත්‍රීවරුන් සහිත, දූෂිතයින් නොමැති, අවංක මන්ත්‍රීවරුන් සහිත පාර්ලිමේන්තුවක් සෑදීම.
- එම නව පාර්ලිමේන්තුව ඇසුරෙන් දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම.
- මන්ත්‍රීවරුන්ගෙන් අයදුම් පත්‍ර කැඳවා පක්ෂ බේදයකින් තොරව සුදුසුකම් අනුව ඇමතිවරුන් 20 ක් සහ නියෝජ්‍ය ඇමතිවරුන් 20 ක් පත්කිරීම.

**2. ආර්ථිකය දියුණු කිරීම**

- රජයේ නියාමනයෙන් යුතු පුද්ගලික සහ රාජ්‍ය ව්‍යවසායන් සහිත මිශ්‍ර ආර්ථික ක්‍රමයක් ඇති කිරීම.
- ලාභ සහිතව දේශීයව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ සහ ආහාර-පාන ආනයනය නතර කිරීම.
- ප්ලාස්ටික් හා නොදිරන ද්‍රව්‍ය වලින් සාදන ලද අනවශ්‍ය භාණ්ඩ ආයනය තහනම් කිරීම.
- දේශිය අමුද්‍රව්‍ය, ශ්‍රමය සහ දියුණු තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කර විදේශීය සමාගම් සමඟ දේශීය ව්‍යවසායකයින් එකතුව සහයෝගීතා කර්මාන්ත ආරම්භ කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
- විදේශ රටක සේවය කිරීමට කැමති සියලු දෙනාටම නොමිළයේ විදේශ රැකියා කිරීමට අවශ්‍ය වෘත්තීය පුහුණුව හා දැනුම ලබා දීම ද, විදේශ රැකියා සොයා දීම ද රජය විසින් කරනු ඇත.
- තරුණ පරම්පරාවට තම පරිඝනක දැණුම භාවිතයෙන් අන්තර් ජාලය සහ සමාජ මාධ්‍ය හරහා ලංකාවේ සිට විදේශ ව්‍යාපෘති සහ රැකියා කර ඩොලර් ඉපැයීමට ඇති බාධා ඉවත් කිරීම.
- ලංකාවට ආවේනික දේශීය වෙදකම, දේශීය සටන් ශිල්ප ක්‍රම, භාවනා ක්‍රම, සරල දිවි පැවැත්ම ආදිය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීමෙන් නව ක්ෂේත්‍රවල රැකියා උත්පාදනය කිරීම.
- මාර්ග නාම, බස්රථ නාම සහ සංඥා පුවරු සඳහා ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛව යොදා විදේශ සංචාරකයින් ආකර්ෂණය ලබා ගැනීම.

**3. අධ්‍යාපනය දියුණු කිරීම**

- පාසල්වල සියලුම ශ්‍රේණිවල ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- පාසැල් අධ්‍යාපනය වසර 12 ක් කර සෑම ළමයෙකුටම එය නොමිළයේ ලබා දීම.
- ඉංග්‍රීසි භාෂාව ද රාජ්‍ය භාෂාවක් කර සෑම පුරවැසියෙකුටම ඉංග්‍රීසි සාක්ෂරතාවය ලබා දීම.
- වසර 5 කට වරක් පාසැල් ගුරුවරුන් පුහුණු පාඨමාලාවලට යොමු කිරීම.
- සාර්ථක කාර්යය සාධනයක් පෙන්වන ගුරුවරුන් හට විශේෂ වැටුප් හා සේවා ප්‍රතිලාභ දීම.
- පෞද්ගලික උපකාරක පන්ති පහසුකම් සහ ගුරුවරුන්ගේ සුදුසුකම් රජයේ නියාමනය.
- සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්වීමට නොහැකි වූ සිසු-සිසුවියන්ට වයස 16 දී තම කැමැත්ත අනුව වෘත්තීය පුහුණු පාඨමාලාවලට යොමු වීමට ආකර්ශණීය පාඨමාලා සහ අවස්ථාවන් ලබාදීම.
- උසස් පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරූ තරුණ ළමයින්ට වයස 18 සම්පූර්ණ වන විට උසස් අධ්‍යාපනය ආරම්භ කිරීමට හෝ රැකියාවක පුහුණුවක් ලැබීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම.
- විශ්වවිද්‍යාල සිසුන්ගේ සියලුම අධ්‍යාපන වියදම් රාජ්‍ය ණයක් ලෙස ලබාදීම.
- නවක වදය අපරාධයක් බවට නීති පනවා දැඩි දඬුවම් දීම.
- තරුණ පරපුරට ආකර්ශනීය නව රැකියා අවස්ථා නිර්මාණය මගින් ශ්‍රම භාවිතය ප්‍රශස්ත කිරීම.

**4. කෘෂිකාර්මාන්තය හා ආහාර සුරක්ෂිතතාව**

- නව කෘෂිකාර්මික තාක්ෂණයන් සහ නවීන ගොවිතැන් පිළිවෙත් හඳුන්වා දීම තුලින් ඵලදායිතාව ඉහළ නැංවීම, නාස්තිය අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.
- ගොවිතැනට සුදුසු කෘෂි ඉඩම් කැබලි කිරීම, ඉදිකිරීම්වලට යොදා ගැනීම තහනම් කිරීම.
- කුඩා ඉඩම් එකතු කර ලාභදායී ගොවිතැනකට ප්‍රමාණවත් තරම් විශාල කිරීමට රජයේ ආධාර සපයා දීම.

- ග්‍රාමීය සේවයට පත් කළ රජයේ නිලධාරීන් කාර්යක්ෂමව සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.
- මහා පරිමණ තේ, රබර් සහ පොල් වතු කුඩා කැබලිවලට කඩා බෙදීම නැවැත්වීම.

**5. කාන්තා, ළමා සහ ජේෂ්ඨ පුරවැසි අයිතිවාසිකම් සුරැකීම**

- කාන්තා හා ළමා හිංසන පැමිණිලි කිරීමට කාන්තා නිලධාරිනියන් පමණක් ඉන්නා පොලිස් ස්ථාන සෑම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කිරීම.
- ජ්‍යෙෂ්ඨ වැඩිහිටියන් සඳහා රජයේ නිකේතන සාදා සැප පහසුකම් සහිතව සතුටින් ජීවත් වීමට වැඩ පිළිවෙලක් සැකසීම.

**6. ණය සහ රාජ්‍ය අය-වැය**

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය මේ අවස්ථාවේදී අගය කරන අතර එයින් මිදී ණය අර්බුදය කළමනාකරණය කිරීම සඳහා විකල්ප උපාය මාර්ග ගැනීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථික විභවයන් ප්‍රයෝජනයට ගෙන ණය හිමියන් සමඟ සෘජුව සම්බන්ධ වී ආපසු ගෙවීමේ සැලසුම් සකස් කිරීම.
- විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ දේශීය කර්මාන්ත දියුණු කිරීම තුලින් වඩාත් ස්ථාවර සහ ස්වයංපෝෂිත ආර්ථිකයක් ඇති කිරීම.
- 2023 ජනවාරි සිට ක්ෂණිකව වැඩි කළ ආදායම් බදු හේතුවෙන් නිපුණ වෘත්තිකයන් සහ උගතුන් රට හැර යාම වැඩි වී ඇත. 2022 දෙසැම්බර් මාසයේ වැටුපට සම වන සේ පළමුව වැටුප් වැඩි කිරීම.
- උපයන විට ගෙවන බදු සීමාවන් වර්තමාන ආර්ථිකයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම.
- දැනට නිසි අයුරින් බදු නොගෙවන නමුත් ජනතාවගෙන් අධික ලෙස අයකරන සේවාවන්හි නිරත වන්නන්ගෙන් බදු අයකර ගැනීම.
- බදු ගෙවන සැමට රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී ඔවුන්ගේ ආර්ථිකය ආරක්ෂා කිරීම.
- බදු මුදල් දේශපාලන සහනාධාර ලෙස බෙදා දී දුප්පත්කම නඩත්තු කිරීම නැවැත්වීම.
- දුප්පත්කම තුරන්කර  ගැනීමට හැකි ආදායමක් ලැබෙන සේවයක නිරත වීමට අවස්ථාව ලබා දීම.


**7. විදේශ ප්‍රතිපත්තිය**

- නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය සහ විදේශ රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම.
- නුසුදුසු තානාපතිවරුන් සහ විදේශ සේවා කාර්යය මණ්ඩලය දේශපාලන බලපෑමෙන් තොරව සුදුසුකම මත පත් කිරීම.
- විදේශ රටවල වෙසෙන ලාංකිකයින්ගේ ප්‍රතිචාරය අනුව තානාපතිවරුන්ගේ කාර්ය සාධනය මැනීම.

**8. ජනාධිපතිවරණයේ දී බුද්ධිත්ව ඔබගේ ඡන්දය දීම**

- මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත්ව ඉන්නා ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහිත, දිගු කාලයක් විශ්වවිද්‍යාල සහ ජාතික අධ්‍යාපන සේවයේ නියුතු, විශ්වවිද්‍යාල ආචාර්ය වෘත්තීය සමිති (FUTA) නිලතල දරා ඇති මා අවංක සුදුසුම පුද්ගලයා කියා සිතවා නම්, සරත් බණ්ඩාරනායක නම සහ පොල්ගෙඩිය ලකුණ ඉදිරියෙන් අංක 1 ලකුණු කර මා හට ඡන්ද දෙන මෙන් ඉල්ලා සිටිමි.
- එසේම 2 වෙනි සහ 3 වෙනි මනාප ද ලකුණු කිරීමෙන් ඔබගේ ඡන්දයේ වටිනාකම දෙගුණයක් කර ගන්න.

සරත් බණ්ඩාරනායක
சரத் பண்டாரநாயக்க
Sarath Bandaranayake



1

**ජාතික සංවර්ධන පෙරමුණ**
தேசிய வளர்ச்சி முன்னணி
National Development Front

දේශයේ සමස්ත සංවර්ධන උදෙසා කැපවෙමු

**කාර්යාලය :-**
අංක 370, මීවතුර, පේරාදෙණිය.

**දුරකථන :-** 071 809 8339 / 070 183 2833 / 0777 965 994
**වෙබ් :-** www.sarathbandaranayake.lk **ඊමේල් :-** join@sarathbandaranayake.lk